දෙපාර්තමේන්තු නියෝග 04/2024

මගේ අංකය : DAPH/AD/16/02/05/2024
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
2024.07.26

අධ්‍යක්ෂ (පරිපාලන/ සත්ත්ව සෞඛ්‍ය/ සත්ත්ව අභිජනන/ මානව සම්පත් සංවර්ධන/ පශු සැලසුම් හා ආර්ථික/ පශු අණ පනත් හා නීති/පශු පර්යේෂණ)
ප්‍රධාන ගණකාධිකාරී
ප්‍රධාන අභ්‍යන්තර විගණක
අංශ ප්‍රධානී (ඉංජිනේරු අංශය)
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී - අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

**<u>තනතුර අතහැර යාමේ නිවේදන නිකුත් කිරීම</u>**

ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය හා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමුකරවමි.

02. සෑම රජයේ නිලධාරියෙකු විසින්ම විධිමත් පරිදි නිවාඩු අනුමත කරවා ගෙන ඇත්නම් මිස, අනිවාර්යයෙන්ම රාජකාරි සඳහා වාර්තා කල යුතුය.

03. යම් නිලධාරියෙකුට සේවයට වාර්තා කිරීමට අපහසු අවස්ථා වලදී, ඒ පිළිබඳ කල්වේලා ඇතිව නියමිත බලධාරියාට දන්වා විධිමත් පරිදි නිවාඩු අනුමත කරවා ගත යුතු අතර එසේ නොවන අවස්ථා වලදී, එම දිනයේ රාජකාරි ආරම්භ කිරීමට නියමිතව තිබූ වේලාවේ සිට පැය 24ක කාලයක් තුල ඒ පිළිබඳ ආයතන ප්‍රධානියා වෙත දැනුම් දීම නිලධාරීයාගේ වගකීම වේ.

04. ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7.2 වැනි වගන්තිය හා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ 214 වගන්තිය ප්‍රකාරව විධිමත් පරිදි නිවාඩු ලබා නොගෙන රාජකාරියට නොපැමිණෙන නිලධාරියෙකු එලෙස නොපැමිණෙන දින සිට තනතුර අතහැර ගියාසේ සලකනු ලැබේ.

05. ඒ අනුව අදාල නිලධාරියාගේ පත්කිරීම් බලධරයා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තුවේ පළාත්/ දිස්ත්‍රික්/ ප්‍රාදේශිය කාර්යාලයේ ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා විසින් අංක 14 වන පරිශිෂ්ටය ප්‍රකාරව තනතුර අතහැර යෑමේ නිවේදනය අදාල නිලධාරියා වෙත ලියාපදිංචි තැපැලෙන් යොමු කල යුතුය.

06. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධරයෙකු එසේ නොදන්වා රාජකාරියට වාර්තා නොකර සිටින අවස්ථා වලදී, තනතුර අතහැර ගියා සේ සලකා, අධ්‍යක්ෂ ජනරාල්ගේ ආවරණ අනුමැතියට යටත්ව තනතුර අතහැර යාමේ නිවේදන නිකුත් කිරීමට අංශ ප්‍රධානීන්/ ඒකක ප්‍රධානීන් විසින් කටයුතු කල යුතුය.

07. මේ සම්බන්ධයෙන් ඔබ අංශය යටතේ වන සියළු ඒකකයන්හි ඒකක ප්‍රධානීන් දැනුවත් කරන මෙන්ද කාරුණිකව දන්වමි.

Hemali Ah

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල

අධ්‍යක්ෂ ජනරාල්

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

පිටපත් :

1. ලේකම්, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
2. සියලුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් - කා.දැ.ගැ.ස
3. විගණකාධිපති - කා.දැ.ගැ.ස